JMC vLearning
"your virtual learning partner"

# වෙළඳපොල ක්‍රමයට රජය මැදිහත් වීම

## AAT අදියර I
## ECN - ආර්ථික විද්‍යාව


ප්‍රසාද් බාලසූරිය
LICA



JMC ජයසේකර කළමනාකරණ මධ්‍යස්ථානය
JAYASEKERA MANAGEMENT CENTRE (PVT) LTD
Estd. 1972

JMC Jayasekera Management Centre (Pvt) Ltd
Pioneers in Professional Education
65/2A, Chittampalam Gardiner Mawatha, Colombo 02 | T: +94 112 430451 | E: info@jmc.lk | F: +94 115 377917

# AAT - අදියර 1

# 103 – ආර්ථික විද්‍යාව

## 06. වෙළඳපොල ක්‍රමයට රජය මැදිහත් වීම

**ආවරණය වන උපමාතෘකා**

6-1 වෙළඳපොල අසමත් වීම

6-2 වෙළඳපොල ආර්ථිකයක රජයේ කාර්යභාරය

6-3 රාජ්‍ය අයවැය ප්‍රතිපත්තිය

6-4 රජය වෙළඳපොලට මැදිහත් වීම

6-5 සාර්ව ආර්ථික මිනුම්

6-6 ව්‍යාපාර චක්‍රය හා ව්‍යාපාර කෙරෙහි එහි බලපෑම

6-7 රාජ්‍ය අසමත් වීම

6-8 ආර්ථික වර්ධනය හා සංවර්ධනය

6-9 මානව සංවර්ධනය

6-10 තිරසාර සංවර්ධනය

JMC vLearning "your virtual learning partner"

## 6.1 වෙළඳපොල අසමත් වීම

සමාජයේ යහපත උදෙසා හිඟ සම්පත් කාර්යක්ෂමතා බෙදා හැරීමේහිලා මිල යාන්ත්‍රණය මඟින් මෙහෙයවන වෙළඳපොල අර්ථක්‍රමය අපොහොසත් වීමයි.

වෙළඳපොල අසමත්වීමට හේතු 03 කි.

- ------------------------------------------------------------------------------------------------
- ------------------------------------------------------------------------------------------------
- ------------------------------------------------------------------------------------------------

ඉහත ආසාර්ථකවීම් හේතුවෙන් රජය වෙළඳපොල ක්‍රමයට මැදිහත් වේ.

## 6.2 වෙළඳපොල ආර්ථිකයක රජයේ කාර්යභාරය

සමාජයේ යහපත උදෙසා හිඟ සම්පත් කාර්යක්ෂමතා බෙදා හැරීමේහිලා මිල යාන්ත්‍රණය මඟින් වෙළඳපොල ආර්ථිකයක රජයේ කාර්යභාරය පහත පරිදි පෙළ ගැස්විය හැක.

- ------------------------------------------------------------------------------------------------
  - පොදු භාණ්ඩ සැපයීම
  - අර්ධ පොදු භාණ්ඩ සැපයීම
  - ශුභසාධන භාණ්ඩ සැපයීම
  - අවගුණ භාණ්ඩ සැපයීම සීමා කිරීම

- ------------------------------------------------------------------------------------------------
  - ආදායම හා ධන ව්‍යාප්තිය ඇති කිරීම
  - ධන සම්මුච්චනය පිළිබඳ සීමා පැනවීම

- ------------------------------------------------------------------------------------------------

  රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය තුලින් උද්ධමනය හා සේවා වියුක්තිය පාලනය කිරීම හරහා සාර්ව ආර්ථික ස්ථායිතාවය ඇති කිරීම, මෙයින් අදහස් වේ.

- ------------------------------------------------------------------------------------------------

  ආර්ථික, සාමාජීය හා පාරිසරික අංශවල තුලනාත්මක වැඩි දියුණු කිරීම තුලින් තිරසාර සංවර්ධනයක් ලඟා කර ගැනීමට කටයුතු කිරීම, මෙයින් අදහස් වේ.

රජය ඉහත අරමුණු ඉටු කර ගැනීම උදෙසා ෆිස්කල් ප්‍රතිපත්තිය භාවිතා කරයි.

JMC vLearning "your virtual learning partner"

## 6.3 ෆිස්කල් ප්‍රතිපත්තිය / අයවැය ප්‍රතිපත්තිය / රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය

- සාර්ව ආර්ථික අරමුණු ලඟා කර ගැනීම උදෙසා රාජ්‍ය වියදම්, රාජ්‍ය බදු හා රාජ්‍ය ණය සම්බන්ධව ගනු ලබන ක්‍රියාමාර්ග හා සිදු කරන වෙනස්කම් ,රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති, ලෙස හඳුන්වයි.
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ ස්වරූප 03 කි.
  - සංකෝචනාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය
    - රාජ්‍ය අයවැය ලේඛනය තුල අතිරික්තයක් පවතින අවස්ථාවයි.
    - එවිට ආදායමේ ප්‍රමාණයට වඩා වියදම් ප්‍රමාණය අඩු බැවින් සමස්ත ඉල්ලුම කෙරෙහි සංකෝචනාත්මක බලපෑමක් සිදු කරයි.
  - ප්‍රසාරණාත්මක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය
    - රාජ්‍ය අයවැය ලේඛනය තුළ හිඟයක් පවතින අවස්ථාවයි.
    - එවිට ආදායමේ ප්‍රමාණයට වඩා වියදම් ප්‍රමාණය වැඩි බැවින් සමස්ත ඉල්ලුම කෙරෙහි ප්‍රමාණාත්මක බලපෑමක් එල්ල කරයි.
  - මධ්‍යස්ථ රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය
    - රාජ්‍ය අයවැය ලේඛනය තුලනය වන අවස්ථාවයි.
    - එවිට මූර්ත නිමැවුම කෙරෙහි උදාසීන තත්ත්වයක් පෙන්නුම් කරයි.
- රටක රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තිය දැක්වෙන ලේඛනය,රාජ්‍ය අය-වැය ලේඛනය, ලෙස හඳුන්වයි.
- රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියේ අංශ 02 කි.
  1. රාජ්‍ය ආදායම
  2. රාජ්‍ය වියදම

## රාජ්‍ය ආදායම

- රජය, රාජ්‍ය වියදම් පියවා ගැනීමට විවිධ මාර්ග ඔස්සේ ආදායම් රැස් කිරීම මෙයින් අදහස් වේ.
- රාජ්‍ය ආදායම ප්‍රධාන කොටස් 02 කි.
  - ------------------------------------------------------------------------------------------
  - ------------------------------------------------------------------------------------------

සාමාන්‍යයෙන් රාජ්‍ය ආදායමේ ප්‍රධාන ප්‍රභවය වන්නේ බදු ආදායමයි. බදු ආදායම තුලින් ප්‍රධාන දෙවර්ගයක බදු දැකිය හැකිය.

1. සෘජු බදු
2. වක්‍ර බදු

| සෘජු බදු | වක්‍ර බදු |
|---|---|
| • පුද්ගල ආදායම, ධනය හෝ ලාභ මත පනවන බදු වේ. | • භාණ්ඩ හා සේවා මත පනවන බදු වේ. |
| • විතැන් කළ නොහැක. | • විතැන් කළ හැකිය. |
| • උදාහරණ:<br>සාමූහික ආදායම් බදු<br>පෞද්ගලික ආදායම් බදු<br>පොලී මත බදු | • උදාහරණ:<br>දේශීය භාණ්ඩ හා සේවා මත බදු<br>ආනයන බදු<br>ජාතිය ගොඩනැගීමේ බදු |

**රාජ්‍ය වියදම**

ආපසු ගෙවීමක් සිදු නොවන රජයේ ගෙවීම්, රාජ්‍ය වියදම් ලෙස හඳුන්වයි.

- ------------------------------------------------------------------------------------------------
- ------------------------------------------------------------------------------------------------

**වර්තන වියදම්**

- වර්ෂයකට වඩා වැඩි කාලයක් සඳහා නිෂ්පාදන ක්‍රියාවලියට යොදා ගනු ලබන මූර්ත වත්කම් අත්පත් ගැනීම හා ප්‍රාග්ධන පැවරුම් හැර අනෙකුත් වියදම් සියල්ල ,වර්තන වියදම්, ලෙස හඳුන්වයි.
- වර්තන වියදම් ප්‍රධාන කොටස් 03 කි.


1. ------------------------------------------------------------------------------------------------
2. ------------------------------------------------------------------------------------------------
3. ------------------------------------------------------------------------------------------------

**ප්‍රාග්ධන වියදම්**

- ස්ථාවර වත්කම් අත්පත් කර ගැනීමට උපකාරී වන, දරනු ලබන වියදමේ ප්‍රතිලාභ වියදම දරනු ලබන කාලයෙන් ඔබ්බට පැතිර යන වියදම් වේ.
- ප්‍රාග්ධන වියදමේ කොටස් 02 කි.

1. ------------------------------------------------------------------------------------------------
2. ------------------------------------------------------------------------------------------------

JMCvLearning "your virtual learning partner"




**රාජ්‍ය අය-වැය ලේඛනය**

- යනු, ඉදිරි වර්ෂය සඳහා රජයක අපේක්ෂිත වියදම හා ඇස්තමේන්තුගත ආදායම පිළිබඳ සඳහන් කරමින් ආර්ථික ප්‍රතිපත්ති සහිතව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර, සම්මත කර ගන්නා වූ මූල්‍ය ඇස්තමේන්තුවයි.
- රාජ්‍ය අයවැය ලේඛනයක ලක්ෂණ

- ඉදිරි මූල්‍ය වර්ෂය වෙනුවෙන් පිළියෙල කිරීම
- ඉදිරි මූල්‍ය වර්ෂයේ වියදම් අන්තර්ගත කිරීම
- ඉදිරි මූල්‍ය වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම් ඇතුලත් කිරීම
- අයවැය හිඟයක් වේ නම් මූල්‍යනය කරන ආකාරය ඇතුලත් කිරීම
- රාජ්‍ය ආර්ථික හා දේශපාලනික තොරතුරු ප්‍රතිපත්ති ඇතුලත් කිරීම
- පාර්ලිමේන්තුවේ බහුතර ඡන්දයෙන් සම්මත වීමෙන් නීතියක් බවට පත් වීම

අය-වැය ශේෂයේ ස්වභාවය අනුව ප්‍රධාන අය-වැය සංකල්ප 03 ක් හඳුනා ගත හැක.

1. හිඟ අය වැය - රාජ්‍ය වියදම, රාජ්‍ය ආදායමට වඩා වැඩි අවස්ථාවක හට ගනී.
2. අතිරික්ත අය-වැය - රාජ්‍ය වියදම, රාජ්‍ය ආදායමට වඩා අඩු අවස්ථාවක අතිරික්ත අය-වැය හට ගනී.
3. තුලිත අය-වැය - රාජ්‍ය ආදායමත්, රාජ්‍ය වියදමත් සමාන වන අවස්ථාවක තුලිත අය-වැය හට ගනී.

**විසර්ජන කෙටුම්පත**

ඉදිරි වසර සඳහා දැරීමට අපේක්ෂිත වියදම් දෙපාර්තමේන්තු සහ අමාත්‍යාංශ වශයෙන් වෙන්කර ලබා ගැනීමට අපේක්ෂිත අය මාර්ග සඳහන් කර, අයවැය හිඟයක් පවතීනම්, එය මූල්‍යණය කරන ආකාරය දැක්වෙන කොටුම්පත, විසර්ජන කෙටුම්පත නම් වේ.

**පරිපූරක ඇස්තමේන්තුව**

විසර්ජන පනත සම්මතවීමෙන් පසු අළුතින් මුදල් අවශ්‍යතාවයක් ඇති වූ විට ඒ සඳහා පාර්ලිමේන්තුවෙන් අනුමැතිය ලබා ගැනීමට, අදාල අමාත්‍යාංශයේ ඇමතිවරයා විසින් ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තුව, පරිපූරක ඇස්තමේන්තුව, නම් වේ.

**අතුරු සම්මත ගිණුම**

කිසියම් අනපේක්ෂිත සිදුවීමක් හේතු කරගෙන, නියමිත කාලය තුලදී අයවැය ලේඛනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නොහැකි වූ විට එය සම්මත කර ගන්නා තුරු ඉදිරි මූල්‍ය වර්ෂය සඳහා අදාල අමාත්‍යාංශ විසින් දැරිය යුතු වියදම් ඒකාබද්ධ අරමුදලින් වෙන් කර ගැනීමට ඉදිරිපත් කරන තාවකාලික ලේඛනයයි.

**රාජ්‍ය අය-වැය පරීක්ෂා කිරීමට යොදාගනු ලබන මිනුම්**

- වර්තන ගිණුමේ ශේෂය (රාජ්‍ය ආදායම - රජයේ වර්තන වියදම)
- සමස්ත ශේෂය (මුළු ලැබීම් - රාජ්‍ය වියදම)
- ප්‍රාථමික ගිණුමේ ශේෂය (මුළු ලැබීම් - රාජ්‍ය ණය පොලී ගෙවීම් හැර රාජ්‍ය වියදම)
- ශුද්ධ මූල්‍ය හිඟය (මුළු ලැබීම් - ණය වාරික ආපසු ගෙවීම හැර රාජ්‍ය වියදම)

## 6.4 රජය වෙළඳපොලට මැදිහත් වීම

මෙහිදී සිදුවන්නේ මිල යාන්ත්‍රණයේ ක්‍රියාකාරීත්වයට රජය විසින් සීමා පැනවීමයි.

මෙලෙස රජය මැදිහත්වන ආකාර කිහිපයකි.

1. ------------------------------------------------------------------------------------------
2. ------------------------------------------------------------------------------------------
3. ------------------------------------------------------------------------------------------
   - උපරිම මිල සීමා පැනවීම
   - අවම මිල සීමා පැනවීම
4. ------------------------------------------------------------------------------------------

### 1. බදු පැනවීම


- රජය විසින් භාණ්ඩ හා සේවා මත පනවන බදු මින් අදහස් වේ.
- රජය විසින් පනවනු ලබන බදු අනුපාතිකවල ස්වරූපය මත බදු වර්ග 2 කි.
  1. ප්‍රතිශත බද්ද
  2. ඒකක බද්ද

### ඒකක බද්දක් පැනවීම

- නිෂ්පාදනය හෝ පරිභෝජනය කරන භාණ්ඩ ඒකකයක් මත කිසියම් මුදල් ප්‍රමාණයක් බදු වශයෙන් අය කිරීම මෙහිදී සිදු වේ.

බදු පැනවීම තුලින්

- සැපයුම් වක්‍රය බවට විතැන් වේ.
- භාණ්ඩ මිල වැඩි වේ.




- බද්ද පැනවීමෙන් පසු පාරිභෝගික හා නිෂ්පාදන අතිරික්තය අඩුවන අතර, ඒ හේතුවෙන් ආර්ථික අතිරික්තය ද අඩු වී යයි.

JMC vLearning "your virtual learning partner"

## 2. සහනාධාර ලබා දීම

- නිෂ්පාදකයා හෝ පාරිභෝගිකයා දිරි ගැන්වීමේ හෝ සහන දීමේ අරමුණින් රජයක් සහනාධාරයන් ලබා දීම මෙයින් අදහස් කරයි.

- සහනාධාරයක් ලබා දීම තුලින්,
  - සැපයුම් වක්‍රය දකුණට විතැන් වේ
  - රාජ්‍ය වියදම් ඉහල යයි
  - බොහෝවිට භාණ්ඩ මිල අඩු වේ




- සහනාධාරය ලබා දීම හේතුවෙන් පාරිභෝගික අතිරික්තය හා නිෂ්පාදන අතිරික්තය ඉහළ යයි.

## 3. මිල පාලනයන්

- කිසියම් භාණ්ඩයක් හෝ සේවාවක් වෙළඳපොලේ නීත්‍යානුකූලව හුවමාරු කර ගැනීමේදී භාවිතා කළ යුතු මිල සම්බන්ධව පනවන සීමාවන් මිල පාලනයන් ලෙස හඳුන්වයි.

- මිල පාලනයන් ඇති කිරීමට හේතු වනුයේ,
  - පාරිභෝගිකයන්ට දැරිය හැකි මිලක් පවත්වා ගෙන යාමට
  - භාණ්ඩ හිඟ කාලවලදී අසාධාරණ මිල ඉහල යාම් වලක්වා ලීමට
  - ඉහල උද්ධමනකාරීත්ව පාලනය කිරීමට
  - භාණ්ඩ සැපයීම වෙනුවෙන් නිෂ්පාදකයන්ට ප්‍රමාණවත් ආදායමක් සැපයීමට

- මිල පාලනයන් ක්‍රියාත්මක කල හැකි ප්‍රධාන ආකාර 02 කි.
  - උපරිම මිල පාලනය
  - අවම මිල පාලනය

JMC vLearning "your virtual learning partner"

1. **උපරිම මිල සීමාව පැනවීම**

- එනම් රජය විසින් භාණ්ඩයක් විකිණිය හැකි උපරිම මිලක් නියම කිරීමයි.
- උපරිම මිල වඩා කාර්යක්ෂම වන්නේ සමතුලිත මිලට වඩා පහල මිලක් උපරිම මිල ලෙස පැනවුවහොත් පමණි.
- පාරිභෝගිකයා ආරක්ෂා කිරීමේ අරමුණින් උපරිම මිල පනවයි.
- උපරිම මිලක් පැනවීමෙන් පාරිභෝගික අතිරික්තය ඉහල යන අතර, නිෂ්පාදන අතිරික්තය අඩු වේ.




- උපරිම මිලක් පැනවීම තුලින් පහත ප්‍රතිවිපාක වලට මුහුණ දීමට සිදු වේ.
- වෙළඳපොල අධි ඉල්ලුම් තත්ත්වයක් නිර්මාණය වීම.
- භාණ්ඩ හිඟ වෙළඳපොල තුල නිර්මාණය වීමෙන් පෝලිම් ක්‍රම, සලාක ක්‍රම ආදිය නිර්මාණය වීම.
- රජය අධි ඉල්ලුම පාලනය නොකලහොත් රට තුළ කළු කඩ වෙළඳපොල නිර්මාණය වීම.
- උපරිම මිල පාලනයකදී පාරිභෝගික අතිරික්තය ඉහල ගොස්, නිෂ්පාදන අතිරික්තය අඩු වේ.

- උපරිම මිල සාර්ථකව පවත්වාගෙන යාමට නම්, රජය අධි ඉල්ලුම පාලනය කල යුතුය. ඒ සඳහා පහත ක්‍රියාමාර්ග ගත යුතුය.
  1. වෙළඳපොලේ හිඟ ප්‍රමාණය ආනයනය කිරීම
  2. සලාක ක්‍රමයක් හඳුන්වා දීම
  3. නිෂ්පාදකයන් දිරිගැන්වීම හා සහනාධාර ලබා දීම

2. අවම මිල සීමා පැනවීම

- එනම්, රජය විසින් යම් භාණ්ඩයක් / සේවාවක් විකිණීම සම්බන්ධ අවම මිලක් පැනවීමයි.
- අවම මිල වඩා කාර්යක්ෂම වන්නේ, සමතුලිත මිලට වඩා ඉහළ මිලක් අවම මිල ලෙස පැනවුවහොත් පමණි.
- නිෂ්පාදනයක් ආරක්ෂා කර ගැනීමේ පරමාර්ථයෙන් බොහෝවිට අවම මිලක් පනවයි.
- අවම මිලක් පැනවීම තුලින් නිෂ්පාදන අතිරික්තය ඉහල යන අතර, පාරිභෝගික අතිරික්තය අඩු වේ.

JMC vLearning "your virtual learning partner"



- අවම මිලක් පැනවීම තුලින් පහත ප්‍රතිවිපාක ජනිත වේ.
  - අධි සැපයුමක් නිර්මාණය වීම
  - අධි සැපයුම රජය විසින් පාලනය නොකලහොත්, මිල විශාල ලෙස පහල යාමට හේතු වීම
  - ඉහල අධි සැපයුම් තත්ත්ව පවතින්නේ නම් ගබඩා පහසුකම් පිළිබඳ ප්‍රශ්න මතු වීම

- අවම මිලක් පැනවීම තුලින්, රජය අපේක්ෂිත අරමුණු මුදුන් පමුණුවා ගැනීමට නම් පහත ක්‍රියාමාර්ග ගත යුතුය.
  - අතිරික්තය රජය මිලදී ගෙන ගබඩා කිරීම
  - අතිරික්තය අපනයනයට පියවර ගැනීම
  - අතිරික්තය යොදාගෙන විකල්ප භාණ්ඩ නිපදවීමට නිෂ්පාදනයක් දිරි ගැන්වීම
  - අදාල භාණ්ඩය සඳහා ආනයන සීමා පැනවීම

## 6.5 සාර්ව ආර්ථික අරමුණු / සාර්ව ආර්ථික මිනුම්

ආර්ථිකයක් අවසන් වශයෙන් මුදුන් පමුණුවා, ගැනීමට අපේක්ෂිත අරමුණු ,සාර්ව ආර්ථික අරමුණු, ලෙස හැඳින්වේ.

සාර්ව ආර්ථික අරමුණු පහත පරිදි පෙළගැස්විය හැක.

1. ------------------------------------------------------------------------------------------

ආර්ථිකය සතු සියළු සම්පත් පූර්ණ හා උපරිම කාර්යක්ෂමතාවයකින් නිෂ්පාදන කටයුතු සඳහා උපයෝජනය කිරීම පූර්ණ සේවා නියුක්තියයි.

2. ------------------------------------------------------------------------------------------

- උද්ධමනයනයක් හෝ අවධමනයකින් තොරව ආර්ථිකයේ මිල මට්ටම හැසිරවීම මෙයින් අදහස් කෙරේ.
- මිල මට්ටමේ ඉහළ / පහළ යාම් මනිනු ලබන්නේ මිල දර්ශක මඟින් වන අතර ඒ තුලින් රට තුල උද්ධමනකාරී තත්ව පවතින්නේද යන්න පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබාගත හැක.

JMC vLearning "your virtual learning partner"

3. ------------------------------------------------------------------------------------------------

එනම් ආර්ථිකය තුළ වාසිදායක ගෙවුම් ශේෂ තත්තවයක් ඇතිකර ගැනීමත්, මුදලේ බාහිර අගය ආරක්‍ෂා කර ගැනීමත්ය.

4. ------------------------------------------------------------------------------------------------

- සාධාරණ ආදායම් ප්‍රතිව්‍යාප්තකරණයක් ඇති කරලීම මින් අදහස් වේ.
- එනම්, ආර්ථිකයක සියළුම පුද්ගලයන්ගේ අවශ්‍යතා සපුරාලිය හැකි පරිදි ආදායම හා ධනය බෙදා හැරීමයි.

5. ------------------------------------------------------------------------------------------------

- රටක මූර්ත දළ ජාතික නිෂ්පාදිතය අඛණ්ඩව ඉහළ යාම මින් අදහස් වේ.
- මෙය ප්‍රමාණාත්මක දියුණුවක් වන අතර ආර්ථික වර්ධන වේගය තුලින් රටක ආර්ථික වර්ධනයේ ප්‍රමාණය මැන බැලේ.

6. ------------------------------------------------------------------------------------------------

- පරිසරයේ ගුණාත්මක බව රැක ගනිමින්, නිෂ්පාදන ඉහළ නංවා ගනිමින්, සියළු ජන කොටස් අතර සාධාරණව ප්‍රතිලාභ බෙදී යාමටත් සැලැස්වීම මෙයින් අදහස් කෙරේ.
- මෙහිදී ආර්ථික, සමාජීය හා පාරිසරික යන සියළුම අංගයන්හි තුලනාත්මක වර්ධනයක් ඇති කිරීම අවධාරණය කරයි.

**සාර්ව ආර්ථික ප්‍රතිපත්ති**

ආර්ථිකයක ඇතිවිය හැකි සාර්ව ආර්ථික ගැටළු විසඳා ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේදී අපේක්ෂිත අරමුණු කරා ආර්ථිකය මෙහෙයවීමට යොදා ගැනෙන ප්‍රතිපත්ති හා උපාය මාර්ග, සාර්ව ආර්ථික ප්‍රතිපත්ති, ලෙස හැඳින්වේ.

එවැනි ආර්ථික ප්‍රතිපත්ති කිහිපයක් පහතින් සාකච්ඡා කෙරේ.

1. මූල්‍ය ප්‍රතිපත්තිය
   - මුදල් සැපයුම, ණය සැපයුම හා පොලී අනුපාතයට සිදු කරන බලපෑම් තුලින් මුදල් සැපයුම වෙනස් කිරීමයි.
   - මූල්‍ය ප්‍රතිපත්තිය උපකරණ ලෙස,
     - මුදල් සැපයුම
     - පොලී අනුපාතය

     දැක්විය හැක.
2. ෆිස්කල් ප්‍රතිපත්තිය
   - රාජ්‍ය ආදායම, රාජ්‍ය වියදම හා රජය ණය වෙනස් කිරීමට බලපෑම් සිදු කරන ආර්ථික ප්‍රතිපත්තියයි.
   - මෙහි ප්‍රධාන උපකරණ ලෙස,
     - රාජ්‍ය වියදම්
     - රාජ්‍ය බදු
     - රාජ්‍ය ණය

     දැක්විය හැක.
3. සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තිය
   - නිෂ්පාදනය දිරි ගැන්වීම සඳහා පහසුකම් සැපයීම සැපයුම් ප්‍රවර්ධන ප්‍රතිපත්තියයි.
   - මෙහි උපකරණ ලෙස,
     - පෞද්ගලීකරණය
     - නියාමනහරණය
     - බදු ප්‍රතිසංස්කරණ

     ආදිය දැක්විය හැක.

4. ආදායම් ප්‍රතිපත්තිය
   - වැටුප් අනුපාත හා භාණ්ඩ මිල ඉහළ යාමේ වේගය අඩු කිරීම සඳහා නීති මඟින් ද, පෙළඹවීමෙන් ද පියවර ගැනීම මෙයින් අදහස් කරයි.

5. විදේශ වෙළඳ ප්‍රතිපත්තිය
   - එනම් නිදහස් අන්තර් ජාතික වෙළඳාමට බලපෑම් කිරීම සඳහා ක්‍රියාමාර්ග ගැනීම මෙයින් අදහස් වේ.
   - මෙහි උපකරණ ලෙස,
     - තීරු බදු
     - අපනයන සහනාධාර
     - සලාකනය
     - ප්‍රපාතනය

   ආදිය දැක්විය හැක.

6. සැපුපාලන ප්‍රතිපත්තිය

   සම්පත්වල හිමිකාරීත්වයත් ව්‍යාප්තියත් වෙනස් කිරීම ද, වෙළඳපොල බලවේග මඟින් තීරණය වන මිල ගණන් වලට බලපෑම් කිරීම සඳහා යොදාගන්නා ක්‍රියාමාර්ග සැපුපාලන ප්‍රතිපත්ති ලෙස හැඳින්විය හැක.

**සාර්ව ආර්ථික ප්‍රතිපත්ති විචලනයන්**


සාර්ව ආර්ථික විචලනයන් ලෙස පහත සංරචක හඳුනාගත හැක.

1. ------------------------------------------------------------------------
2. ------------------------------------------------------------------------
3. ------------------------------------------------------------------------
4. ------------------------------------------------------------------------
5. ------------------------------------------------------------------------
6. ------------------------------------------------------------------------

සාර්ව ආර්ථික විචල්‍යයන් ⟶ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති ⟶ සාර්ව ආර්ථික අරමුණු

## 6.6 ව්‍යාපාර චක්‍රය හා ව්‍යාපාර කෙරෙහි එහි බලපෑම

- කාලයත් සමඟ මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ ඉහල හා පහල යාම ''ව්‍යාපාර චක්‍ර'' ලෙස හඳුන්වයි.



JMCvLearning "your virtual learning partner"

- ව්‍යාපාර චක්‍රය තුල අවධි 04 ක් හඳුනාගත හැක.

1. පසුබැසීමේ අවධිය

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

2. පතුල අවධිය

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

3. ප්‍රසාරණ අවධිය

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

4. මුදුනත අවධිය

______________________________________________

______________________________________________

______________________________________________

______________________________________________

## 6.7 රාජ්‍ය අසමත් වීම

- වෙළඳපොල අසාර්ථකවීම් වළක්වා ගැනීමට රජය විසින් ආර්ථිකය සඳහා කරනු ලබන මැදිහත්වීම් රාජ්‍ය අංශයට ආවේණික දුර්වලතා කරණකොට ගෙන අපේක්ෂිත ප්‍රතිඵල ලබා නොදී, ආර්ථිකය තුළ තවත් අකාර්යක්ෂමතා නිර්මාණය කිරීම ,රාජ්‍ය අසමත් වීම, නම් වේ.
- රාජ්‍ය අසමත්වීම් සඳහා හේතු කිහිපයකි.

  - ______________________________________________
  - ______________________________________________
  - ______________________________________________
  - ______________________________________________

JMC vLearning "your virtual learning partner"

- ------------------------------------------------------------------------------------------------
- ------------------------------------------------------------------------------------------------
- සමාජ අරමුණු හා රාජ්‍ය අරමුණු අතර ගැටී මත පැවතීම
- එහිදී ඡන්දදායකයන්ගෙන් එල්ල වන පීඩනය නිසා අනවශ්‍ය වියදම් හට ගැනීම

## 6.8 ආර්ථික වර්ධනය සහ සංවර්ධනය

**ආර්ථික වර්ධනය**

- යනු කිසියම් නිශ්චිත කාල පරිච්ඡේදයක් තුල රටක මූර්ත දළ දේශීය නිෂ්පාදිතයේ අඛණ්ඩ ඉහල යාමක්.
- මෙය ප්‍රමාණාත්මක දියුණුවකි.
- ආර්ථික වර්ධනය තුලින් නිෂ්පාදන හැකියා මායිම දකුණට විතැන් වේ.
- ආර්ථික වර්ධනය, මනිනු ලබන්නේ ආර්ථික වර්ධන වේගය ගණනය කිරීමෙනි.

$$\text{ආර්ථික වර්ධන අනුපාතය} = \frac{\text{මූර්ත දල දේශීය නිෂ්පාදිතයේ වෙනස}}{\text{පෙර වර්ෂයේ මූර්ත දළ දේශීය නිෂ්පාදිතය}} \circ 100$$

**ආර්ථික වෘද්ධිය තීරණය කරන සාධක**

- ------------------------------------------------------------------------------------------------
    - භෞතික ප්‍රාග්ධනය
    - මානව ප්‍රාග්ධනය
    - ස්වභාවික ප්‍රාග්ධනය
    - සමාජ ප්‍රාග්ධනය
- ------------------------------------------------------------------------------------------------
    - තාක්ෂණය
    - නම්‍යතා හා බිහිවීම
    - පර්යේෂණ හා සංවර්ධනය සඳහා ආයෝජනය
- ------------------------------------------------------------------------------------------------
- ------------------------------------------------------------------------------------------------
- ------------------------------------------------------------------------------------------------
- ------------------------------------------------------------------------------------------------

ආර්ථික වෘද්ධියක වාසි

- සේවා නියුක්තිය ඉහල යාම
- ජීවන මට්ටම ඉහල යාම
- සාර්ථක රාජ්‍ය මූල්‍ය කළමනාකරණයක් පවත්වා ගත හැකිය
- ආයෝජනය ශක්තිමත් වීම
- විශ්වාසනීයත්වය වර්ධනය වීම නිසා ලාභ වැඩි වීම

### ආර්ථික වෘද්ධියක අවාසි

- පාරිසරික ගැටළු ඇති වීම
- ආදායම් විෂමතා හට ගැනීම
- ප්‍රාදේශීය විෂමතා ඇති වීම
- ආර්ථිකයේ උද්ධමනකාරී තත්ත්වයක් පැන නැගීම
- වර්තමාන පාරිභෝජනය පහළ යාම

### ආර්ථික වෘද්ධියකදී ආර්ථිකයක් තුල සිදුවන ව්‍යුහාත්මක වෙනස්කම්

- කෘෂි අංශයේ සාපේක්ෂ දායකත්වය ක්‍රමයෙන් පහත වැටීම.
- කාර්මික අංශයේ සාපේක්ෂ දායකත්වය ක්‍රමයෙන් ඉහළ යාම.
- ආර්ථිකයේ වැදගත්ම අංශය බවට සේවා අංශය පත් වීම.

### ආර්ථික සංවර්ධනය

- මිනිස් ජීවිතයේ ආර්ථික, දේශපාලනික, සමාජීය හා සංස්කෘතික ආදී සියළුම පැතිකඩවල ප්‍රමාණාත්මක හා ගුණාත්මක වාසි දියුණුවීමක් ,ආර්ථික සංවර්ධනය, ලෙස හඳුන්වයි.
- ආර්ථික සංවර්ධනයක් සඳහා ආර්ථික වෘද්ධික් පැවතීම අනිවාර්ය වේ.
- ආර්ථික වෘද්ධිය ප්‍රමාණාත්මක දියුණුවක් වන අතර ආර්ථික සංවර්ධනය ප්‍රමාණාත්මක හා ගුණාත්මක යන දෙඅංශයෙන්ම දියුණුවක් වේ.
- ආර්ථිකයක් තුළ සිදුවන ගුණාත්මක වෙනස්කම් පහත පරිදි පෙළගැස්විය හැක.

  - ------------------------------------------------------------------------
  - ------------------------------------------------------------------------
  - ------------------------------------------------------------------------
  - ------------------------------------------------------------------------
  - ------------------------------------------------------------------------
  - ------------------------------------------------------------------------

### ආර්ථික වෘද්ධිය හා සංවර්ධනය අතර පවත්නා වෙනස්කම්

- ආර්ථික වෘද්ධිය තුලින් නිෂ්පාදන ධාරිතාවය ප්‍රසාරණය වීමක් පෙන්නුම් කරන අතර, ආර්ථික සංවර්ධනය තුලින් මිනිස් ජීවිතයේ ගුණාත්වය ඉහළ යාමක් පෙන්නුම් කරයි.
- ආර්ථික වෘද්ධිය තුලින් ප්‍රමාණාත්මක දියුණුවක් පෙන්නුම් කරන අතර, ආර්ථික සංවර්ධනය තුලින් ප්‍රමාණාත්මක මෙන්ම ගුණාත්මක දියුණුවක් පෙන්නුම් කරයි.
- ආර්ථික වර්ධනය, ආර්ථික වර්ධන වේගය තුලින් මැන බැලෙන අතර,ආර්ථික සංවර්ධනය මැන බැලීම සඳහා විවිධ මිනුම් භාවිතා කරයි.

JMC Learning "your virtual learning partner"

## 6.9 මානව සංවර්ධනය

මානව සංවර්ධනය යනු, මිනිසුන් විසින් තම මානව හැකියාවන් වර්ධනය කර ගැනීමත් සමඟම එම හැකියාවන් ආර්ථික, සමාජීය, සංස්කෘතික හා දේශපාලනික ක්ෂේත්‍රයන්හි භාවිතා කිරීමට ඇති හැකියාව ලබාදීමත්, අනාගත පරම්පරාවට ද එම අයිතිය තහවුරු කිරීම වේ.

මානව සංවර්ධනය පැතිකඩ ලෙස පහත දෑ හඳුනා ගත හැක.

- ----------------------------------------
- ----------------------------------------
- ----------------------------------------
- ----------------------------------------
- ----------------------------------------
- ----------------------------------------
- ----------------------------------------

## 6.10 තිරසාර සංවර්ධනය

අනාගත පරම්පරාවන්ට තම අවශ්‍යතා සපුරා ගැනීමට ඇති ඉඩකඩ අහිමි නොකරමින්, වර්තමාන පරම්පරාව තම අවශ්‍යතා සපුරා ගැන්ම තිරසාර සංවර්ධනය ලෙස හඳුන්වයි.

තිරසාර සංවර්ධනයක දී පහත පැතිකඩ කෙරෙහි අවධානය යොමු කරයි.

- ----------------------------------------
  ----------------------------------------
- ----------------------------------------
  ----------------------------------------
- ----------------------------------------
  ----------------------------------------
- ----------------------------------------
  ----------------------------------------
- ----------------------------------------
  ----------------------------------------
- ----------------------------------------
  ----------------------------------------

## 6.11 ශ්‍රී ලාංකීය ආර්ථිකයේ නව ප්‍රවණතා

- ශ්‍රී ලංකාවේ දළ දේශීය නිෂ්පාදිතය තුළ කෘෂි කාර්මික අංශයේ සාපේක්ෂ වැදගත්කම අඩු වී කාර්මික හා සේවා අංශයේ වැදගත්කම වැඩි වී ඇත.
- සේවා නියුක්ති ව්‍යුහය තුල කෘෂි අංශයේ සේවා නියුක්තිය අඩු වී, කාර්මික හා සේවා අංශවල සේවා නියුක්තිය ඉහළ ගොස් ඇත.

JMC vLearning "your virtual learning partner"

- කාන්තාවන්ට සාපේක්ෂව පිරිමි ශ්‍රම බලකා සහභාගීත්වය අනුපාතය ඉහළ අගයක් ගන්නා නමුත්, කාන්තා ශ්‍රම සහභාගීත්වය මෑත කාලීනව ඉහළ යාමක් දක්නට ලැබේ.
- විවෘත ආර්ථිකය සමඟ ශ්‍රී ලංකාවේ සේවකයන් විදේශ රටවලට ඇදී යාමේ ප්‍රවණතාවය ඉහළ ගොස් අතර, ඒ නිසාම විදේශයන්ගෙන් ගලා එන ප්‍රේෂණ ප්‍රමාණය වැඩි වී ඇත.
- ශ්‍රී ලංකාවේ සංචාරක කර්මාන්තය පසුගිය වසර කිහිපය තුලම දියුණුවක් වාර්තා කර ඇත.

**විශේෂ අවධානයට**

| | වර්ෂය |
|---|---|
| ඒක පුද්ගල ආදායම | ---------------- |
| ආර්ථික වර්ධන වේගය | ---------------- |
| සේවා නියුක්ති අනුපාතය | ---------------- |
| සේවා වියුක්ති අනුපාතය | ---------------- |

## 6.12 ප්‍රශ්න පොතට

1. වෙළඳපොලට අසමත් වීමට හේතු කවරේද?
2. වෙළඳපොල ආර්ථිකයක රජයේ කාර්යභාරය ලැයිස්තුගත කරන්න.
3. ඍජු බදු හා වක්‍ර බදු අතර වෙනස්කම් මොනවාද?
4. රාජ්‍ය වියදමේ සංරචක මොනවාද?
5. පරිපූරක ඇස්තමේන්තුව, අතුරු සම්මත ගිණුම හා විසර්ජන කෙටුම්පත යන පද වෙන් වෙන්ව හඳුන්වන්න.
6. උපරිම මිල සීමා කිරීමක ප්‍රතිඵල කවරේද?
7. අවම මිල සීමා පැනවීමක ප්‍රතිඵල කවරේද?
8. බද්දක් පැනවීම තුලින් භාණ්ඩයේ මිලට වන බලපෑම ඉල්ලුම සැපයුම් වක්‍ර ඇසුරින් පැහැදිලි කරන්න.
9. සාර්ව ආර්ථික මිනුම් පෙල ගස්වන්න.
10. සාර්ව ආර්ථික ප්‍රතිපත්ති කිහිපයක් සඳහා උදාහරණ දෙන්න.
11. ව්‍යාපාර ඒකකයේ දැකිය හැකි අවාසි මොනවාද?

12 රාජ්‍ය අසමත් වීමට හේතු කවරේද?

13. ආර්ථික වර්ධනය තීරණය කරන සාධක කවරේද?
14. ආර්ථික වෘද්ධියේ වාසි / අවාසි පෙල ගස්වන්න.
15. මානව සංවර්ධනයේ පැතිකඩ මොනවාද?
16. ආර්ථිකව වර්ධනය, ආර්ථික සංවර්ධනයෙන් වෙනස් වන්නේ කෙසේද?
17. තිරසාර සංවර්ධනය කෙටියෙන් පැහැදිලි කරන්න.
18. ශ්‍රී ලාංකීය ආර්ථිකයේ නව ප්‍රවනතා තුනක් දක්වන්න.

JMC vLearning "your virtual learning partner"

අමතර සටහන්

JMC vLearning "your virtual learning partner"

JMC vLearning "your virtual learning partner"

JMC vLearning "your virtual learning partner"

JMC vLearning
"your virtual learning partner"